## 1.1 තත්ත්වාගණනය කළ මතය

මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යයනය සඳහා වූ ජාතික මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මධ්‍යස්ථානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය මධ්‍යස්ථානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මධ්‍යස්ථානයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මධ්‍යස්ථානයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස මධ්‍යස්ථානයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා මධ්‍යස්ථානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මධ්‍යස්ථානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මධ්‍යස්ථානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මධ්‍යස්ථානය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

----------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | විශ්වවිද්‍යාල ආචාර්යවරුන් විසින් පෙර වර්ෂවල PhD හා MPhil ප්‍රදාන ලබා ගෙන තිබූ නමුත් ඔවුන් විසින් අදාළ පාඨමාලා හැදෑරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ආපසු ගෙවන ලද රු. 2,870,000 ක මුදල සමාලෝචිත වර්ෂයෙන් ලද භාණ්ඩාගාර ප්‍රතිපාදන ලෙස සලකා ආදායම් ප්‍රකාශනයට බැර කර තිබුණි. | 2019 අවසාන ගිණුම්වල නිවැරදි කරමි. | වර්ෂයට අදාල ආදායම් හෝ ප්‍රදාන අදාළ වර්ෂයේ ආදායමට ගැලපිය යුතුය. |
| (ආ) | PhD හා MPhil ප්‍රදාන අයභාර ආදායම් සේ සලකා කටයුතු කළ බව ගිණුම්කරණ සටහන් 2.11 මඟින් හෙළිදරවු කර තිබුණ ද පෙර වර්ෂවලට අදාළව රු. 5,722,143 ක් වූ MPhil ප්‍රදාන වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස සලකා සමාලෝචිත වර්ෂයේ අවසන් ගිණුම්වල දක්වා තිබුණි. | මෙම වැය නොවූ ප්‍රදාන 2019 වර්ෂයේ ප්‍රදාන වශයෙන් ලබා දීමට සැලසුම් කර ඇත. | ගිණුම්කරණ සටහන් වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබිය යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | පෙර වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේ දී ලැබුණු රු.373,476 ක් වූ ආයෝජන පොළී සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි. | 2017 වර්ෂයට අදාලව ලැබිය යුතු පොලිය ගණනය කිරීමේදී සිදු වී ඇති මගහැරීම හේතුවෙන් රු.373,476/- ක පොලි ආදායම 2018 වර්ෂයේ ආදායම ලෙස සලකා ඇත. | වර්ෂයට අදාළ ඌනතාවය/ අතිරික්තය ගණනය කිරීමේදී වර්ෂයට අදාළ ආදායම් සහ වියදම පමණක් හඳුනා ගත යුතුය. |

**1.5.3 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2005 අංක 02 දරන මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා නියමාවලියේ 16 (1) ඡේදය | මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂවරයා පූර්ණකාලීන නිලධාරියෙකු විය යුතු වුවදවර්ෂයේ 2011 සිට 2019 මාර්තු 15 දින දක්වා එම තනතුර සඳහා එවැනි නිලධාරියෙකු පත්කර නොතිබුණි. | අධ්‍යක්ෂවරයා විසින් 2019.05.01 වන දින සිට අවුරුදු තුනක කාලපරිච්ඡේදයක් සඳහා ආයතනයේ පූර්ණ කාලීන අධ්‍යක්ෂවරයා ලෙස පත් කර ඇත. | නියමාවලිය අනුව මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂකවරයා සෑම විටම පූර්ණකාලීනව කටයුතු කරන නිලධාරියෙකු විය යුතු බැවින් පූර්ණ කාලීන නිලධාරියෙකු පත් කිරීමට කටයුතු කල යුතුය. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2005 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුලදී ආචාර්යවරුන් 18 දෙනෙකු විසින් ලබාගෙන තිබූ එකතුව රු. 13,521,456 ක ප්‍රදාන වලට අදාල අධ්‍යයන කටයුතු නිම නොකිරීම හේතුවෙන් අවලංගු කර තිබුණි. අදාල ආචාර්යවරුන්ගෙන් එම ප්‍රදාන මුදල් අයකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන | ප්‍රදාන ලබා ගත් ආචාර්යවරු අධ්‍යයන කටයුතු නිම නොකිරීම හේතුවෙන් අවලංගු කරන ලද ප්‍රදාන වල වටිනාකම 2019 මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී හෙලිදරව් කිරීමට කටයුතු | ආචාර්යවරුන් වෙත ප්‍රදාන ලබාදීමේදී අදාළ අධ්‍යයන කටයුතු නියමිත කාලවකවානුව තුළ නිම කළ යුතු බවට කොන්දේසි නියම කළ යුතු අතර ඒ |

| | | |
|---|---|---|
| නොතිබුණු අතර ඒ සම්බන්ධව ගිණුම්වල හෙළිදරව් කිරීමක්ද කර නොතිබුණි. | කරමි. | සම්බන්ධයෙන් පසු විපරම් කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

---------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.111,357,311 ක ඌනතාවයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.1,237,688 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.112,594,999 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ආචාර්ය උපාධි ප්‍රදාන සහ දර්ශනපති ප්‍රදාන සඳහා දරන ලද වියදම ඉහළයාම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය**

--------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් ප්‍රභවයන් වූ භාණ්ඩාගාරයෙන් ලබාදෙන ලද පුනරාවර්තන ප්‍රදාන හා ආචාර්ය උපාධි දර්ශනපති ප්‍රදාන එකතුව රු.60,631,000 ක් පෙර වර්ෂයේ එම ආදායම වූ රු.76,977,493 ක් සමඟ සැසඳීමේදී රු.16,346,493 ක් හෙවත් සියයට 21 ක පහළයාමක් විය. එසේම සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන වියදම් අයිතමයන් වූ සේවක පාරිශ්‍රමික හා ආචාර්ය උපාධි ප්‍රදාන හා දර්ශනපති ප්‍රදාන සඳහා වියදම වූ රු.166,371,204 ක් පෙර වර්ෂයේ වියදම වූ රු.71,595,606 සමඟ සැසඳීමේදී රු.94,775,598 ක් හෙවත් සියයට 132 ක වැඩිවීමක් නිරීක්ෂණය විය.

**2.3 අනුපාත විශ්ලේෂණය**

-------------------------

අරමුදලේ ජංගම අනුපාතය සමාලෝචිත වර්ෂයේ 0.22:1 ක් වූ අතර පසුගිය වර්ෂයේ දී එම අනුපාතය 1.44:1 ක් වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මෙම මධ්‍යස්ථානය පිහිටුවීමේ හා පවත්වාගෙන යාමේ ප්‍රධාන අරමුණ විශ්වවිද්‍යාල මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා ආචාර්යවරුන්ට දර්ශනශූරි හා දර්ශනපති උපාධි සම්පූර්ණ කර ගැනීම සඳහා මූල්‍ය ප්‍රදාන ලබාදීම විය. එසේ වුවද 2005 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා දර්ශනශූරි හා දර්ශනපති උපාධිලාභීන් 493 දෙනෙකුට රු. 733,506,686 ක මූල්‍ය ප්‍රදානයන් ලබා දී තිබූ අතර ඉන් ප්‍රදානලාභීන් 42 ගේ අධ්‍යයන කටයුතු අක්‍රීය තත්ත්වයේ පැවති අතර | සාපේක්ෂව මුල් අවධියේදී ප්‍රතිලාභීන් සම්බන්ධව ඉටුකල යුතු පූර්ව කොන්දේසි නොමැති වුවද වර්තමානයේදී සැලකිය යුතු කොන්දේසි ප්‍රමාණයක් ඉදිරිපත් කිරීමත් ඒවා ඉටුකිරීමට අයදුම්කරුවන් අපොහොසත් වීමත් හේතු කොටගෙන ප්‍රදානයන් ලබා දීමේ අඩු වීමක් දක්නට ලැබුනි. | මධ්‍යස්ථානයේ අරමුණු ඉටුවන අයුරින් ප්‍රදානලාභීන් අඩුවීමට හේතු හඳුනාගෙන එම කරුණු සමාලෝචනයට ලක්කර ප්‍රදානලාභීන් සංඛ්‍යාව ඉහළ තත්ත්වයට ගෙන ඒමට කටයුතු කළ යුතුය. එසේම මෙම ප්‍රදාන ලබාදීමේදී අදාළ පාඨමාලා නියමිත කාලපරිච්ඡේදය තුළ සම්පූර්ණ කළ යුතු බවට කොන්දේසි ඇති කිරීම ද කල යුතුය. |

මුදල් ප්‍රදාන ලබා දී ඇති සංඛ්‍යාව 2005 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ 60 සිට 6 දක්වා වූ සියයට අනුවක පහළයාමක් නිරීක්ෂණය විය .

**3.2 අරමුදල් ඌන උපයෝජනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වැය නොවූ ප්‍රාග්ධන ප්‍රදාන ලෙස දක්වා ඇති රු. මිලියන 8.4 ක මුදලින් අයිතම 03 කට අදාලව රු. මිලියන 7.8 ක ප්‍රාග්ධන ලැබීම් වර්ෂයකට වැඩි කාලයක සිට අපේක්ෂිත කාර්යයන් සඳහා යොදවා නොතිබුණි. | මෙම අරමුදල් 2019 වර්ෂයේදී අදාළ අරමුණු කෙරෙහි යෙදවීමට බලාපොරොත්තු වෙමි. | වාර්ෂිකව ලැබෙන භාණ්ඩාගාර අරමුදල් අදාළ වර්ෂයේදීම හඳුනාගත් අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් යෙදවීමට කටයුතු කළ යුතුය. |

**4. වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පශ්චාත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා 2013 වර්ෂයේ සිට ඉදිරි වර්ෂ 05 ක කාල පරිච්ඡේදයකට අදාළව උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, Queensland University of Technology Brisbane – Australia ආයතනය සමඟ අත්සන් කර තිබූ අවබෝධතා ගිවිසුමට අනුව වර්ෂයකට පශ්චාත් උපාධිධාරීන් 30 දෙනෙකු වෙත ප්‍රදාන ලබා දිය යුතුව තිබුණි. එසේ වුවද කාර්යසාධන දත්ත අනුව 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා ප්‍රදානලාභීන් 17 දෙනෙකු සඳහා පමණක් ප්‍රදාන ලබා දී තිබුණි. මේ අනුව අපේක්ෂිත ප්‍රතිලාභීන් 13 දෙනෙකු වෙත ප්‍රදාන ලබා දීමට අවස්ථාව උදාකර නොතිබූ බැවින් | ඕස්ට්‍රේලියාවේ විශ්වවිද්‍යාලයකට ඇතුලත් වීම සඳහා IELTS සාමාන්‍ය අගය 6.5ක් තිබීම ප්‍රමාණවත් වුවද NCAS ප්‍රදානයන් ලබා දීම සඳහා එම අගය 7.0 ක් තිබීම අත්‍යාවශ්‍ය වේ. එසේම NCAS ප්‍රදානයන් ලබා දීම සඳහා වන අනෙකුත් පූර්ව අවශ්‍යතා ඉටු කිරීමට අයදුම්කරුවන් අපොහොසත් වීම හේතුවෙන්ද මෙලෙස ප්‍රදානයන් ලබා දීමේ අඩුවීමක් සිදු වී ඇත. | පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ඇතුළත් කර ගැනීමට අදාළව වෙනත් ආයතනවල සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා ද සැලකිල්ලට ගෙන නව පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ඇතුළත්වීමට සපුරාලිය යුතු මූලික හා අනෙකුත් පූර්ව අවශ්‍යතා නැවත සමාලෝචනයට ලක්කිරීම කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | කාර්යසාධන ඉලක්ක කරා ළඟා වී නොමැති බව නිරීක්ෂණය විය. | | |
| **(ආ)** | පර්යේෂණ සංස්කෘතිය නංවාලීම සඳහා විපරාවර්තනීය චින්තනය දිරිගැන්වීම යටතේ විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යමණ්ඩලය වෙනුවෙන් පර්යේෂණ කටයුතු සඳහා සමාලෝචිත වර්ෂය තුල ආරාධිත දේශන දෙකක් 25 දෙනෙකුගේ සහභාගීත්වයෙන් පැවැත්වීමට අපේක්ෂාකර තිබුණි. එහෙත් එක් ආරාධිත දේශනයක් පමණක් පවත්වා තිබූ අතර ඒ සඳහා 10 දෙනෙකු වැනි අඩු සංඛ්‍යාවක් සහභාගී වී තිබුණි. | මෙම තත්වය මග හරවා ගෙන නව මුහුණුවරකින් ආරාධිත දේශන පැවැත්වීමට 2019 වර්ෂයේදී කටයුතු කරමින් පවතී. | ක්‍රියාකාරි සැලැස්මේ ඉලක්කගත අරමුණු උපරිම වශයෙන් ලඟා කර ගැනීමට අදාළ ක්‍රියාමාර්ග ගත යුතුය. |
| **(ඇ)** | විශ්වවිද්‍යාල පද්ධතිය තුළ පරිපාලන හා අනධ්‍යයන කාර්යමණ්ඩල කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා පැවැත්වීමට සැලසුම් කර තිබූ පාඨමාලා 05 ක් අතුරින් පාඨමාලා 03 ක් පමණක් පවත්වා තිබුණි. එසේම මෙම පාඨමාලා වෙනුවෙන් 50 දෙනෙකු සහභාගී කර තිබුණද සත්‍ය වශයෙන් සහභාගී වී තිබූ ප්‍රමාණය 11 දෙනෙකු පමණක් විය. | 2018 වර්ෂයේ දි EVIEWS පාඨමාලා 2ක් පැවැත්විමට සැලසුම් කර තිබූ අතර ඉන් එකක් 2018 දෙසැම්බර් මස 14 , 15 යන දිනයන්හිදි පැවැත්වීමට නියමිතව තිබුනි. පාඨමාලාව සඳහා සාහභාගිවන්නගේ ඉල්ලීම මත එම පාඨමාලා 2019 ජනවාරි මාසයේ 23 , 24 දිනයන්හි පවත්වනු ලැබිනි. | සැලසුම් සකස් කිරීමේදී ලඟා කර ගත හැකි ඉලක්ක හඳුනා ගැනීමට එම ඉලක්ක ලඟා කර ගැනීමටත් උපායශීලීව කටයුතු කිරීමත් කළ යුතුය. |